චක්‍රලේඛ අංක - 02/2020

මගේ අංකය-ඊටී/1(2)XIII වෙළම
ජාතික තරුණ සේවා සභාව
තැ.පෙ.අංක17,
මහරගම.
2020.04. 24 දින.

ජාතික තරුණ සේවා සභාවේ,
සියළුම අධ්‍යක්ෂවරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්,
පළාත් අධ්‍යක්ෂවරුන්,
දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන්,
දිස්ත්‍රික් තරුණ සේවා නිලධාරින්,
මධ්‍යස්ථාන නිලධාරින්,
තරුණ සේවා නිලධාරින් වෙත.

අපේ ගෙවත්ත අභිමානවත් තාරුණ්‍යයක්,සෞභාග්‍යමත් හෙටක්ගෙවතු වගා තරගයට සමගාමීව ක්‍රියාත්මක වැඩබිමේ,ගොවිබිමක් වැඩ සටහනේ පළාත් කාර්යාල, දිස්ත්‍රික් කාර්යාල,ගොවිපල මධ්‍යස්ථාන සහ තරුණ මධ්‍යස්ථාන ආශ්‍රිතව වගා කටයුතු ඇගයිමට ලක්කිරිම.

ලෝකය හමුවේ කොරෝනා වෛරස් ආසාධනය තුලින් ජන ජීවිතය අඩාල වෙමින් පවතින තත්වයක් තුල ඉදිරියේදී ආහාර හිඟයක් නිර්මාණය විය හැකිය.අපනයන හා ආනයන වෙළඳ රටාව බිඳවැටීමෙන් ස්වයං භාවිත කෘෂිකර්මික රටාවක් නිර්මාණය කර ගැනීම අත්‍යාවශ්‍ය වනු ඇත.

ඒ අනුව එවන් චින්තනයක් සහිත ජන ප්‍රජාවක් තුල තරුණයාගේ කාර්යභාරය නිර්මාණය කරනු වස් හා එකී තරුණයාගේ සක්‍රීය දායකත්වය ලබාදීම ද, ඒ සඳහා පූර්වා දර්ශනයන් ඇතිකිරීමට ද අරමුණු කර ගනිමින්,

ජාතික තරුණ සේවා සභාවට අයත් ප්‍රධාන කාර්යාලය, පළාත් කාර්යාල, දිස්ත්‍රික් කාර්යාල, තරුණ මධ්‍යස්ථාන හා ගොවිපොළ මධ්‍යස්ථාන තුල වගා සංග්‍රාමයක් ආරම්භ කරමින් එම ව්‍යාපෘතිය ඇගයීමට ලක්කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ.

01. වැඩ සටහනේ අරමුණු -

01. මේ වන විට දිවයින පුරා ආරම්භ කර ඇති ඉහත ව්‍යාපෘතිය යටතේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය, පළාත් කාර්යාල පරිශ්‍ර, දිස්ත්‍රික් කාර්යාල පරිශ්‍ර,ගොවිපොල මධ්‍යස්ථාන සහ තරුණ මධ්‍යස්ථානයන්ගේ වගා කටයුතු ඇගයිමකට ලක්කිරිම.

02. ප්‍රධාන කාර්යාල,පළාත් කාර්යාල,දිස්ත්‍රික් කාර්යාල,තරුණ මධ්‍යස්ථාන අතර තරගයන් පවත්වා ඇගයිම තුළින්,මූල්‍යමය ත්‍යාග ලබා දිම හා ගෙවතු වගාවන් ආරම්භ කර ක්‍රියාත්මක කිරිම පිළිබඳව සේවකයන් තුල අභිප්‍රේරණය ඇති කිරිම හා තරුණ ගෙවතු වගාවන්ට ආදර්ශයක් සැපයිම.

03. වර්තමානයේදී සමස්ථ ලෝකය ප්‍රමුඛව ශ්‍රී ලංකාවද මුහුණපා සිටින වෛරස් ආසාදන තත්වය යටතේ සමාජ දුරස්ථභාවය හඳුනා ගනිමින්,අනාගත ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාමට ඉඩ ප්‍රස්ථාව සැලසීම.

04. ජාතික තරුණ සේවා සභාව ඔස්සේ තරුණ සංවර්ධන ක්ෂේත්‍රයන් තුල නියුතු,නිලධාරින්ගේ හා කාර්ය මණ්ඩලයේ සක්‍රිය දායකත්වය ආහාර සුරක්ෂිතතාව හා නිෂ්පාදන ක්‍රියාවලියට යොමු කරලීම.

02. ක්‍රියාත්මක කරන ආකාරය

01. ජාතික තරුණ සේවා සභාවේ පළාත් කාර්යාල,දිස්ත්‍රික් කාර්යාල මුල් කරගත් වගා කටයුතු ඇගයීම.

මෙහිදී,

- වගා කටයුතු පිළිබඳව යෞවන සමාජ, තරුණ කණ්ඩායම්, නිලධාරින් දැනුවත් කිරීම, හඳුන්වාදීම,පෙළඹවීම සහ මූලික අවශ්‍යතාවයන් සලසාදීම. (බීජ වර්ග සහ තාක්ෂණික දැනුම)
- ඊට අදාල කාර්යභාරයන් සැලසුම් කිරීම,සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම කෙරෙහි ඉටුකල ක්‍රියාමාර්ගයන් සැලකිල්ලට ගැනීම.
- වගා කටයුතු සාර්ථක කරගැනීම උදෙසා බාහිර ආයතනයන්, පාර්ශවයන් වෙතින් සේවා සපයා ගැනීම.
- වගා කටයුතු වල නිරතව ඇති පුද්ගල සංඛ්‍යාව,ගෙවතු වගා සංඛ්‍යාව,වගා භූමි ප්‍රමාණයන් සහ ආහාර විවිධත්වය මත වගාකර ඇති බීජ වර්ගයන් සැලකීම. (ඉහත ව්‍යාපෘතිය යටතේ ආරම්භ කර ඇති ප්‍රාදේශිය මට්ටමේ ගෙවතු වගාවන් හි ප්‍රගතිය ආශ්‍රයෙන් 25% ක් ප්‍රතිශතාත්මක ලකුණු ප්‍රමාණයක් ලබා දෙන අතර ඉතිරි 75% ලකුණු ප්‍රමාණය දිස්ත්‍රික් වගා කාර්ය සැලකිල්ලට ගෙන ලබා දෙනු ඇත.)
- වගා කටයුතු ආශ්‍රයෙන් ආරම්භයේ සිට විවිධ අවස්ථාවන් ආවරණය වන පරිදි ලබාගෙන ඇති ඡායාරූප සහ සනාථ කලහැකි ලිපි ලේඛණ පවත්වා ගෙන යාම.
- වැඩ සටහන ආරම්භකර පවත්වාගෙන යාම සඳහා නිලධාරින්ගේ මැදිහත්වීම සහ දායකත්වය සලසා ගැනීම ඊට නායකත්වය ලබාදීම පිළිබඳ සැලකීම.
- පරිසර සුරක්ෂිතතාවය සහ රසායනික ද්‍රව්‍ය වලින් තොරව වගාව පවත්වාගෙන යාම, ජලය සහ පස සංරක්ෂණ ක්‍රමවේදයන් අනුගමනය කිරීම.
- වගා කටයුතු සඳහා පෘෂ්ඨීය භාවිතය .(භූමිය මෙන්ම නිර්මාණාත්මක පෘෂ්ඨීයක් - උදා :- වහලය,කොන්ක්‍රීට් ස්ලැබ්,බැල්කනි)
- වගා කටයුතු සඳහා බාධා සහිත ගොඩනැල්ලක දිස්ත්‍රික් කාර්යාලය හෝ පළාත් කාර්යාලය පිහිටා තිබේනම් දිස්ත්‍රික්කය/පළාත ඇතුළත සුදුසු ස්ථානයක් කාර්යාලිය වගා තරගාවලිය භාවිතා කල හැකිය.

03. 02 ජාතික තරුණ සේවා සභාවේ ගොවිපොල මධ්‍යස්ථාන,තරුණ මධ්‍යස්ථාන ආශ්‍රිතව වගා කටයුතු ඇගයීම

සැ.යු:- ගොවිපල මධ්‍යස්ථානය ආශ්‍රිතව වගාවන් පවත්වාගෙන යාම හා ඊට අදාල උපදෙස් පසුව ලබා දෙනු ඇත.

මෙහිදි,

- සැලසුම් කිරිම, සංවිධානය,ක්‍රියාත්මක කිරිම සහ නියාමනය සැලකිල්ලට ගනු ඇත.
- දේශගුණික තත්වයන් හා සමාජ අවශ්‍යතාවයන් පදනම්ව බෝග විවිධාංගිකරණයෙන් යුතුව වගා කටයුතු සිදුකිරිම.
- වගා කටයුතු සදහා යොදාගෙන ඇති භූමි ප්‍රමාණය සහ ඒ උදෙසා තාක්ෂණික ක්‍රමවේදයන් අනුගමනය කිරිම.
- රසායනික පොහොර භාවිතයකින් තොරව ක්‍රියාත්මක ගෙවතු වගා ක්‍රමයක් ක්‍රියාත්මක කිරිම.

- වගා කටයුතු පවත්වාගෙන යාම සදහා යෙදවුම් භාවිතය.
(මානවසම්පත්,තාක්ෂණිකක්‍රම සහඋපකරණ,පාරිසරික සංරක්ෂණය,ජලය,පාංශු සුරක්ෂිතතාවය.)
- වගා බෝග තෝරා ගැනිමේදි වෙළදපල වටිනාකම. (සමාජ ඉල්ලුම් සැලකිල්ලට ගැනිම)
- බීජ යෙදවුමේදි අඩු පිරිවැය සහ වැඩි අස්වැන්න පිළිබදව සැලකිලිමත් විම.
- ශ්‍රම භාවිතයෙදි අඩු ශ්‍රමය යෙදවිම තුලින් වර්තමානය තුල පවත්වාගෙන යනු ලබන සමාජ දුරස්ථභාවය ආරක්ෂා කිරිම.
- වගා කටයුතු සදහා භූමිය මෙන්ම රසානික ද්‍රව්‍ය භාවිතයට නොගෙන මේ වන විට භාවිතයට නොගත් පෘෂ්ඨයන් යොදාගැනිම.(උදා- ROOF TOP,SLAB,BALCANEY,WALL).

04.වැඩ සටහන් ආරම්භය 2020.05.01

මේ සමග ඉදිරිපත් කරනු ලබන ආකෘති.

01. තරගයට අයත් නිර්ණායකයන් සහ ලකුණු සටහන.
02. වෙන්කරනු ලබන ප්‍රතිපාදන.
03. අයදුම්පත්‍රය.
04. ඡායාරූප හා ප්‍රගතිවාර්තා ලබාගැනිම.
05. දිස්ත්‍රික්කයකින්/මධ්‍යස්ථානයේ වගා සැලැස්ම.

තෙෂාර ජයසිංහ
අධ්‍යක්ෂ ජනරාල්/සභාපතිතුමා
ජාතික තරුණ සේවා සභාව.

පිටපත්-

01. ප්‍රධාන අභ්‍යන්තර විගණක- ජා.ත.සේ.ස- දැන ගැනිම සදහා.